# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සදහන් තනතුරු සදහා අපේක්ෂිත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පුහුණු තනතුරු**

1) **පෙදරේරු 111 ශ්‍රේණිය**
2) **වඩුකාර්මික 111 ශ්‍රේණිය**
3) **වැද්දුම්කරු 111 ශ්‍රේණිය**
4) **කාර්මික 111 ශ්‍රේණිය**

**වැටුප් පරිමාණය (රු 48,005-16 x 490 -55,845 [U-PL 3(III) ]**

**සුදුසුකම්**

I. ඉහත අදාල තනතුරු වල කාර්යයන්ට අදාල තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (N.V.Q) 4 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

III. රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

IV. මනා චරිතයකින් හෙබි විය යුතුය.

V. වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

5) **විදුලි කාර්මික 111 ශ්‍රේණිය - (මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල උප ඒකකය සදහා)**

**වැටුප් පරිමාණය (රු 48,005-16 x 490 -55,845 [U-PL 3(III) ]**

**සුදුසුකම්**

**I.** විදුලි කාර්මික තනතුරේ කාර්යයට අදාල තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (N.V.Q) 4 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**II.** ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

**III.** රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

**IV.** මනා චරිතයකින් හෙබි විය යුතුය.

V. වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

<u>අර්ධ පුහුණු තනතුරු</u>

01 **ට්‍රැක්ටර් ක්‍රියාකරු 111 ශ්‍රේණිය තනතුර -**

(මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල උප ඒකකය, දොඩම්ගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා)

වැටුප් පරිමාණය (රු 44,575 – 16 x 490- 52,415 [U-PL 2(III) ]

<u>**සුදුසුකම්**</u>

**I.** අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම හා තනතුරට ආදාලව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (N.V.Q) 2හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**හෝ**

**II.** අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබිය යුතු අතර කාර්මික නිපුණතා සහිතව අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද තිබිය යුතුය.

**III.** ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

**IV.** මනා චරිතයකින් හෙබි විය යුතුය.

**V.** වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**මීට අමතරව ට්‍රැක්ටර් ක්‍රියාකරු 111 ශ්‍රේණිය තනතුර සඳහා පහත සුදුසුකම්ද සපුරා තිබිය යුතුය.**

I. සියලුම බර වාහන පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් තිබිය යුතුය.

II. ධාවන අලුත්වැඩියාවන් කර ගැනීමට හැකියාවක් තිබිය යුතුය.

III. අවම වශයෙන් අවුරුදු 03ක වාහන පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

IV. අවම උස අඩි 05 අගල් 2 ½ විය යුතුය.

V. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

VI. දිවා සහ රාත්‍රි කාලයේදී රාජකාරියේ යෙදීම සඳහා සුදුසු යහපත් ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්තව සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

<u>නුපුහුණු තනතුරු</u>

<u>වැඩ සහයක **(III ශ්‍රේණිය)** - මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල උප ඒකකය</u>

වැටුප් පරිමාණය - රු: 42775-16x450 -49975 (U-PL 1)

<u>සුදුසුකම් :</u>

I. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සම්මාන 2ක් සහිතව සමත්විය යුතුය.

II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

III. රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

IV. මනා චරිතයකින් හෙබි විය යුතුය.

V. වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

<u>සටහන:</u>

(අ). මෙම පුරප්පාඩු ලිඛිත හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය පදනම් කරගෙන පුරවනු ලැබේ. මේ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය විශ්වවිද්‍යාලය සතුය.

(ආ) ඉහත සඳහන් වැටුපට අමතරව, රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත දීමනාද ගෙවනු ලැබේ.

(ඇ). රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ. කෙසේ වුවද එබඳු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ සමඟ සහතික කරන ලද වර්තමාන වැටුප් විස්තරද එවිය යුතුය.

(ඈ). තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයට ද දායක වනු ඇත. ඒ අනුව සේවකයාගේ වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන අතර, එම වැටුපෙන් 7% කට හා 8% කට සමාන වන කොටස් සේව්‍යයා විසින් පිළිවෙලින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. මීට අමතරව සේව්‍යයා විසින් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

(ඉ) අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ වී සහ අවුරුදු 45 නොඉක්මවී තිබිය යුතුය.

(ඊ) අයදුම්පත් http://www.pdn.ac.lk/vacancies/ යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල ජායා පිටපත් සමඟ 2026.05.12 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **“නියෝජ්‍ය ලේඛකාධිකාරි, අනධ්‍යයන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය”** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර පෞද්ගලිකව භාරදෙන අයදුම්පත් සම්බන්ධව වග කියනු නොලැබේ. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(උ) තමන් විසින් අයදුම්කරනු ලබන තනතුරෙහි නම අයදුම්පත්‍රයේ පැහැදිලිව සඳහන් කර එවිය යුතුවේ. එසේම තනතුරෙහි නම අයදුම්පත්‍රය එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර එවිය යුතුවේ.

වැඩබලන ලේඛකාධිකාරි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය